# (ආ) කාර්මික නිෂ්පාදනය[1]

## හැඳින්වීම

කාර්මික නිෂ්පාදනය පිළිබඳව, පහත දැක්වෙන විශ්ලේෂණය පදනම් වී ඇත්තේ, පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්හි නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධව මහ බැංකුව සහ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය විසින් පවත්වන ලද සමීක්ෂණයන් මතය. සංඛ්‍යා තොරතුරු රැස්කර ගැනීමෙහි ලා අප විසින් අනුගමනය කළ පිළිවෙත වූයේ තැපැල් මගින් කරුණු විමසා දැන ගැනීමය. මහ බැංකු සමීක්ෂණයට 1968 ලිත් වර්ෂය ඇතුළත් වෙයි. මේ සඳහා මිඩංගු කළ හැකි කාල සීමාව සීමිත වූ හෙයින් මෙම සමීක්ෂණයෙන් ආවරණය වන කාලසීමාව දීර්ඝ කිරීමට හෝ වඩාත් පැහැදිලි තොරතුරු ලබාගෙන ඒවා විශ්ලේෂණය කිරීම හෝ අපහසු වෙයි. දුම්කොල සහ සකස් කළ ආහාර කර්මාන්තවල ඉතා කුඩා ප්‍රමාණයක ආයතන රාශියක් තිබීම නිසාත් සංඛ්‍යා තොරතුරු සකස් කිරීමෙහිලා ඒවා අතින් ම වක්‍රගත කිරීමට සිදුවූ නිසා මෙම කාර්යය වඩාත් දුෂ්කර විය.

නිෂ්පාදන කර්මාන්තයන් පිළිබඳ වූ මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ, නිෂ්පාදන කර්මාන්තයේ ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය — සංඛ්‍යා ප්‍රමාණය, සේවා නියුක්තිය, වැටුප්, අමුද්‍රව්‍ය භාවිතය යනාදිය පිළිබඳව සම්පූර්ණ අවබෝධයක් ලබාදීම සහ මුළු කාර්මික අංශයෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි ඒ ඒ කර්මාන්තය හෝ කර්මාන්ත ගණය විසින් දායක වන අයුරු හැදෑරීමත්ය. ඉකුත් වර්ෂයන් හා සැසැඳීමක් මත 1968 දී කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අගය කිරීමක් කර ඇති නමුත් ප්‍රධාන කොටම ඒ ඒ කර්මාන්ත, ඒකකයන්හි ඇති වෙනස්කම් නිසා කිසියම් වර්ෂ දෙකක මුළු ගණන් සෑම අතින්ම නො සැසඳෙන බව සැලකිය යුතුය. 1968 මැයි මාසයේදී විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ඇරඹීමට පෙර ආනයනය කළ කාර්මික අමුද්‍රව්‍ය වෙන් කිරීම නිසාත් වසරින් වසර සංසන්දනය කිරීම ව්‍යාකූල වනු ඇත. බීඩි ඔතන කොල ආනයන සඳහා වූ වෙන් කිරීම් අඩුකරලීම[2] නිසා විවෘත වෙළඳ පොලේ තරඟකාරී මිල ගණන් වලට ඒවා මිල දී ගැනීමට නොහැකි වූ නිසාත් මහ බැංකු සමීක්ෂණයට ඇතුලත් වූ බීඩි නිෂ්පාදකයින් බොහෝ සංඛ්‍යාවක් 1968 දී සිය නිෂ්පාදනයන් නවතාලීය. එහෙත් මේවා ප්‍රධාන වශයෙන්ම සුළු ප්‍රමාණයේ ව්‍යවසායයන් වූ අතර, මුළු නිෂ්පාදනයෙහි ලා ඒවායේ දායකත්වය කිනම් ලෙසකින් වුවද එතරම් වැදගත් නොවීය. වෙනත් සියළුම වැදගත් නිෂ්පාදන ගණයන්හි ආවරණ පරිපථය මේ වර්ෂයේදී වැඩි වූ හෙයින් කාර්මික නිෂ්පාදනයෙහි වාර්තාගත වටිනාකමේ විශාල වැඩිවීමක් ඇතිවිය. මේ අතරම 1968 දී ආනයනය කළ අමුද්‍රව්‍ය බොහෝ සෙයින් සුලභ වූ බව ද මෙකී වැඩිවීමෙන් පිළිබිඹු වෙයි. ඇත්ත වශයෙන් සියළුම කර්මාන්තයන්ම ඒ ඒ ආනයනය කළ අමුද්‍රව්‍ය මත ඒ ඒ ප්‍රමාණයන්ගෙන් යැපෙන්නට විය. අමුද්‍රව්‍ය ආනයනය සඳහා වූ විදේශීය විනිමය සලාකයන්, ලබාගැනීම තරමක් දුරට ලිහිල් කර තිබුණ ද, මුළු නිෂ්පාදන ධාරිතාවටම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ඒවා ප්‍රමාණවත් නොවීම නිසා 1967දී කර්මාන්ත බොහොමයක්ම නිෂ්පාදන ධාරිතාවට අඩුවෙන් නිෂ්පාදනය කෙරින. විවෘත පොදු බලපත්‍ර යටතේ වූ ආනයන ද ඇතුළුව අමුද්‍රව්‍ය හා යන්ත්‍ර ආනයනය සඳහා පෞද්ගලික අංශයට 1968 දී දෙන ලද විදේශ විනිමය වෙන් කිරීම් 1967 ප්‍රමාණයට වඩා සියයට 300 කට ආසන්න ප්‍රමාණයකින් වැඩිවිය. තවද, 1968 මැයි මාසයේ දී වි. වි. හි. ස. ක්‍රමය ඇරඹීමත් සමගම 1962 න් පසුව දැඩි විනිමය හා ආනයන පාලනයනට යටත්ව පැවැති මූලික අමු ද්‍රව්‍ය බොහොමයක්ම විවෘත පොදු බලපත්‍ර යටතේ ලබාගත හැකිවිය. වර්ෂයේ දෙවැනි භාගයේදී නිෂ්පාදන ප්‍රමාණය හා වටිනාකම මුල් භාගයේදීට වඩා හැම විටදීම බොහෝ සෙයින් වැඩි වී ඇති බව ව්‍යාපාරික ආයතනයන් විසින් අර්ධ වාර්ෂිකව සපයන ලද සෑම වාර්තාවකින්ම පාහේ පෙනී යයි. 1967 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල අවප්‍රමාණ කිරීම නිසා ආනයනය කළ භාණ්ඩ බොහොමයකම මිල ඉහළ නැගුන බවද, සැලකිය යුතුය. සේවකයින්ට අවප්‍රමාණ දීමනාවක් ගෙවීමට සිදුවීම නිසාත්, අවප්‍රමාණ කිරීමෙන් පසු ආනයනය කළ යෙදවුම් වල රුපියල් මිල ඉහල යාමත් හේතුකොට ගෙන සාධක මිල ඉහල යාම නිසා, දේශීය කර්මාන්ත ව්‍යාපාරිකයන් විසින් ද සිය මිල ගණන් වැඩි කරන ලදී. මේ අනුව, වාර්තාගත කාර්මික නිෂ්පාදන වටිනාකමෙහි වැඩිදීම, සෑහෙන දුරකට අමුද්‍රව්‍ය මිලට ගැනීමේ වියදම හා යෙදවුම් වල සාධක මිල, යන දෙකෙහිම මිල වැඩිවීම පිළිබිඹු වෙයි.

---

1. ජාත්‍යන්තර වශයෙන් සම්මත තත්වයේ කාර්මික වර්ගීකරණයට පුළුල් වශයෙන් අනුකූල වන පරිදි ඉකුත් වර්ෂවලදී යොදා ගන්නාලද වර්ගීකරණ ක්‍රමය මෙම වර්ෂයේදී අප විසින් සංශෝධනය කර තිබේ. පහසුවෙන් හඳුනාගත හැකි ලක්ෂණයන්ගෙන් හෙබි සියළුම සම වර්ගවල කාර්මික ක්‍රියාකාරිත්වයන් එක් ගණයකට වර්ග කර ඇති ප්‍රධාන ගණ 9 ක් අප විසින් විස්තර කර ඇත.

2. අපගේ සමීක්ෂණයට ඇතුළත් නොවුන නව නිෂ්පාදන ඒකකයන් 3000 කට පමණ අළුත් වෙන් කිරීම් ලබා දී ඇති බව පෙනී යයි.

කාර්මික නිෂ්පාදනය හා
සංඛ්‍යා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | | මිනිස් දින එකතුව (දහස් ගණනින්) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | 1968 | 1965 | 1966 | 1967 | 1968 | 1965 | 1966 | 1967 | 1968 |
| 1. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය ... | 727 | 711 | 822 | 588* | 20688 | 21838 | 26401 | 24878 | 5521 | 5831 | 7251 | 7122 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | 228 | 249 | 393 | 496 | 18121 | 21102 | 20052 | 35528 | 4932 | 5504 | 5324 | 9301 |
| 3. ද්‍රව සහ ද්‍රව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) ... | 1 | 1 | 14 | 20 | 624 | 744 | 2453 | 2575 | 187 | 222 | 458 | 752 |
| 4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය ... | (0 | 54 | 78 | 90 | 2347 | 2369 | 2660 | 4146 | 667 | 674 | 673 | 1187 |
| 5. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය ... ... | 191 | 204 | 246 | 284 | 7697 | 7509 | 8117 | 11213 | 2047 | 1964 | 1916 | 3124 |
| 5. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) ... | 13 | 13 | 61 | 53 | 2241 | 2216 | 6118 | 6084 | 633 | 595 | 1581 | 1670 |
| 7. මූලික ලෝහ නිෂ්පා-දිතයන් ... ... | — | — | — | 1 | — | — | — | 950 | — | — | — | 260 |
| 8. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය ... ... | 124 | 144 | 183 | 253 | 4491 | 5124 | 7648 | 15529 | 1189 | 1194 | 1970 | 3932 |
| 9. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) ... | 36 | 21 | 33 | 19 | 626 | 516 | 506 | 445 | 160 | 139 | 144 | 114 |
| එකතුව | 1381 | 1394 | 1830 | 1804 | 56835 | 61418 | 73955 | 101348 | 15336 | 16123 | 19315 | 27462 |

* ආයතන 365 ක් සඳහා වැටුප් වැය

**රැකිරක්ෂා 1965 – 68 සංඛ්‍යාමය විස්තර**
**සටහන II (ආ) 1**

| වැටුප් වැය (රු. දශ ලක්ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | මිනිස් දින වැටුප (රුපියල්) | | | | සේවකයෙකුට වෙන් වන මිනිස් දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1965 | 1966 | 1967 | 1968 | 1965 | 1966 | 1967 | 1968 | 1965 | 1966 | 1967 | 1968 | 1965 | 1966 | 1967 | 1968 |
| 35.2 | 38.5 | 52.0 | 46.8 | 415.5 | 389.9 | 422.3 | 609.6 | 6.38 | 6.60 | 7.17 | 6.57 | 267 | 267 | 275 | 286 |
| 20.9 | 25.5 | 25.8 | 46.0 | 171.5 | 178.9 | 177.1 | 224.3 | 4.24 | 4.63 | 4.85 | 4.95 | 272 | 261 | 266 | 262 |
| 1.8 | 2.0 | 3.1 | 6.6 | 5.2 | 6.5 | 10.4 | 16.9 | 9.63 | 9.00 | 6.77 | 8.78 | 300 | 298 | 187 | 292 |
| 4.1 | 4.3 | 5.2 | 8.9 | 29.3 | 33.8 | 34.7 | 54.6 | 6.15 | 6.38 | 7.73 | 7.50 | 284 | 284 | 253 | 286 |
| 13.1 | 13.8 | 15.9 | 30.8 | 125.3 | 137.2 | 136.7 | 203.3 | 6.40 | 7.03 | 8.30 | 9.86 | 266 | 261 | 236 | 279 |
| 5.9 | 5.0 | 11.2 | 17.1 | 40.2 | 32.5 | 69.5 | 92.8 | 9.32 | 8.40 | 7.08 | 10.24 | 282 | 269 | 258 | 275 |
| — | — | — | 3. 4 | — | — | — | 27.3 | — | — | — | 13.08 | — | — | — | 274 |
| 7.1 | 7.6 | 14.1 | 28.2 | 58.7 | 69.8 | 102.0 | 167.1 | 5.97 | 6.37 | 7.16 | 7.17 | 265 | 233 | 258 | 253 |
| 0.5 | 0.7 | 0.7 | 0.6 | 1.3 | 1.7 | 1.5 | 2.7 | 3.13 | 5.04 | 4.93 | 5.26 | 256 | 269 | 281 | 256 |
| 88.6 | 97.4 | 128.0 | 188.4 | 847.0 | 850.3 | 954.2 | 1398.6 | 5.78 | 6.04 | 66.2 | 6.86 | 270 | 263 | 261 | 271 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 1964/68 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම —

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | |
|---|---|---|---|---|---|
| | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
| **1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය ...** | **257.7** | **415.5** | **389.9** | **422.3** | **609.6** |
| (අ) ආහාර නිෂ්පාදන ... ... | 46.3 | 109.2 | 134.5 | 130.6 | 250.0 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද ... | 114.4 | 190.4 | 142.3 | 139.7 | 162.0 |
| (ඇ) කල්තබාගත් සහ ටින් වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර | 3.8 | 5.4 | 5.1 | 6.7 | 8.4 |
| (ඈ) විස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි ... ... ... | 30.9 | 34.9 | 38.6 | 33.3 | 44.3 |
| (ඉ) සිසිල් බීම කර්මාන්තය ... ... | 16.1 | 23.6 | 17.1 | 20.0 | 34.4 |
| (ඊ) දුම්කොළ ... ... ... | 46.2 | 52.0 | 52.3 | 92.0 | 110.5 |
| **2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත ...** | **78.3** | **171.5** | **178.9** | **177.1** | **224.3** |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) ... | 54.9 | 55.5 | 56.1 | 48.1 | 55.7 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි වියීම සහ නිම කිරීම ... | — | 91.3 | 95.1 | 97.1 | 136.2 |
| (ඇ) පාවහන් සහ සම්භාණ්ඩ ... ... | 23.4 | 24.7 | 27.7 | 31.9 | 32.4 |
| **3. දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව)** | **3.9** | **5.2** | **6.5** | **10.4** | **16.9** |
| (අ) දැව නිෂ්පාදිත ... ... ... | — | — | — | 3.6 | 8.0 |
| (ආ) තුනී ලෑලි ... ... ... | 3.9 | 5.2 | 6.5 | 6.8 | 8.9 |
| **4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ ... ...** | **30.1** | **29.3** | **33.8** | **34.7** | **54.6** |
| **5. රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය ... ...** | **102.3** | **125.3** | **137.2** | **136.7** | **203.3** |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය ... ... | 1.0 | 1.6 | 1.9 | 1.9 | 2.3 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් ... | 73.7 | 91.2 | 101.9 | 98.2 | 118.9 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් ... | — | — | — | — | 8.3 |
| (ඈ) රබර් නිෂ්පාදිතයන් ... ... | 17.0 | 19.1 | 18.9 | 20.7 | 41.3 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් ... ... | 10.6 | 13.4 | 14.5 | 15.9 | 32.5 |
| **6. ලෝහ නොවූ ඛණිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) ...** | **26.3** | **40.2** | **32.5** | **69.5** | **92.8** |
| (අ) පිඟන් බඩු ... ... ... | 2.4 | 2.4 | 2.3 | 4.4 | 8.5 |
| (ආ) වීදුරු සහ වීදුරු භාණ්ඩ ... ... | — | — | — | — | 4.8 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති භාණ්ඩ සහ ඇස්බැස්ටොස් නිෂ්පාදිතයන් ... ... | 23.0 | 36.5 | 28.8 | 53.5 | 70.0 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය ... ... | 0.9 | 1.3 | 1.4 | 1.4 | 2.2 |
| (ඉ) ගඩොල් සහ උළු ... ... | — | — | — | 10.2* | 7.3 |
| **7. මූලික ලෝහ භාණ්ඩ ... ... ...** | — | — | — | — | **27.3** |
| යකඩ සහ වානේ මූලික කර්මාන්ත ... | — | — | — | — | 27.3 |
| **8. සකස් කරන ලද ලෝහ භාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය ... ... ...** | **38.5** | **58.7** | **69.8** | **102.0** | **167.1** |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) ... ... ... | 38.5 | 44.7 | 49.0 | 54.1 | 79.4 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර සූත්‍ර) සහ ප්‍රවාහණ උපකරණ ... ... ... | — | — | — | 19.8 | 45.9 |
| (ඇ) විදුලි යාන්ත්‍රික උපකරණ, අනෙකුත් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ... ... | — | 14.0 | 20.8 | 28.1 | 41.8 |
| **9. නිෂ්පාදිත භාණ්ඩ ( අන් තැනක සඳහන් නොවූ) ...** | **0·4** | **1.3** | **1.7** | **1.5** | **2.7** |
| **එකතුව ... ...** | **537.5** | **847.0** | **850.3** | **954.2** | **1,398.6** |

*වීදුරු සහ වීදුරු භාණ්ඩ ඇතුලත් වේ.

## කර්මාන්ත වල ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදිත අනුව වර්ග කොට

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **47.9** | **49.1** | **45.9** | **44.3** | **43.6** |
| 18.0 | 26.3 | 34.5 | 30.9 | 41.0 | 8.6 | 12.9 | 15.8 | 13.3 | 17.9 |
| 44.4 | 45.8 | 36.5 | 33.1 | 26.6 | 21.3 | 22.5 | 16.7 | 13.0 | 11.6 |
| 1.5 | 1.3 | 1.3 | 1.6 | 1.4 | 0.7 | 0.6 | 0.6 | 0.7 | 0.6 |
| 12.0 | 8.4 | 9.9 | 7.9 | 7.3 | 5.7 | 4.1 | 4.5 | 3.5 | 3.2 |
| 6.2 | 5.7 | 4.4 | 4.7 | 5.6 | 3.0 | 2.8 | 2.0 | 2.8 | 2.4 |
| 17.9 | 12.5 | 13.4 | 21.8 | 18.1 | 8.6 | 6.1 | 6.2 | 8.9 | 7.9 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **14.6** | **20.2** | **21.0** | **18.6** | **16.0** |
| 70.1 | 32.4 | 31.4 | 27.2 | 24.8 | 10.2 | 6.5 | 6.6 | 5.0 | 4.0 |
| — | 53.2 | 53.1 | 54.8 | 60.7 | — | 10.8 | 11.2 | 10.2 | 9.7 |
| 29.9 | 14.4 | 15.5 | 18.0 | 14.5 | 4.4 | 2.9 | 3.2 | 3.4 | 2.3 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **0.7** | **0.6** | **0.8** | **1.1** | **1.2** |
| — | — | — | 34.6 | 47.3 | — | — | — | 0.4 | 0.6 |
| 100.0 | 100.0 | 100.0 | 65.4 | 52.7 | 0.7 | 0.6 | 0.8 | 0.7 | 0.6 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **5.6** | **3.5** | **4·0** | **3.6** | **3.9** |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **19.0** | **14.8** | **16.1** | **14.3** | **14.5** |
| 1.0 | 1.3 | 1.4 | 1.4 | 1.1 | ... | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| 72.0 | 72.8 | 74.3 | 71.8 | 58.5 | 13.7 | 10.8 | 12.0 | 10.3 | 8.5 |
| — | — | — | — | 4.1 | — | — | — | — | 0.6 |
| 16.6 | 15.2 | 13.8 | 15.2 | 20.3 | 3.3 | 2.2 | 2.2 | 2.2 | 3.0 |
| 10.4 | 10.7 | 10.5 | 11.6 | 16.0 | 2.0 | 1.6 | 1.7 | 1.6 | 2.3 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **4.9** | **4.7** | **3.8** | **7.3** | **6.6** |
| 9.1 | 6.0 | 7.1 | 6.3 | 9.1 | 0.4 | 0.3 | 0.3 | 0.5 | 0.6 |
| — | — | — | — | 5.2 | — | — | — | — | 0.3 |
| 87.5 | 90.8 | 88.6 | 77.0 | 75.4 | 4.3 | 4.3 | 3.4 | 5.6 | 5.0 |
| 3.4 | 3.2 | 4.3 | 2.0 | 2.4 | 0.2 | 0.1 | 0.1 | 0.1 | 0.2 |
| — | — | — | 14.7 | 7.9 | — | — | — | 1.1 | 0.5 |
| — | — | — | **100.0** | **100.0** | — | — | — | — | **2.0** |
| — | — | — | 100.0 | 100.0 | — | — | — | — | 2.0 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **7.2** | **6.9** | **8.2** | **10.7** | **12.0** |
| 100.0 | 76.1 | 70.2 | 53.0 | 47.5 | 7.2 | 5.3 | 5.8 | 5.7 | 5.7 |
| — | — | — | 19.4 | 27.5 | — | — | — | 2.1 | 3.3 |
| — | 23.9 | 29.8 | 27.5 | 25.0 | — | 1.6 | 2.4 | 2.9 | 3.0 |
| **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **0.1** | **0.2** | **0.2** | **0.1** | **0.2** |
| | | | | | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## ප්‍රධාන උපනතීන්

1968 දී කාර්මික නිෂ්පාදන වටිනාකමෙහි ඇති වූ රුපි. දශ ලක්ෂ 444.4 ක අති මහත් වැඩිවීම II (ආ) 1 සංඛ්‍යා සටහනින් දක්වෙයි. මෙය වාර්තාගත වී ඇති 1967 කාර්මික නිෂ්පාදන වටිනාකම ඉක්මවා සියයට 46.6 කින් වැඩිවීමකි. මෙම නිෂ්පාදන වැඩිවීමට හේතු වූයේ ඉල්ලුම් හා සැපයුම් අංශයන් දෙකෙහි ක්‍රියාත්මකවූ සාධකයන් හේතු කොට ගෙනය. මූර්ත ආදායම්වල වැඩිවීම, ආහාර සහ රෙදිපිළි වැනි පාරිභෝගික භාණ්ඩ කෙරෙහි බලපෑමක් ඇති කරන ලදී. 1968 දී වාර්තාගතවී ඇති සැබෑ කාර්මික නිෂ්පාදන වටිනාකම වැඩිවීමට හේතු වූයේ පාරිභෝගික භාණ්ඩ ගණයන්, ආහාර පාන වර්ග සහ දුම්කොල සහ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් කර්මාන්තයන්ය. ( මින් මතු සංක්ෂිප්ත වශයෙන් රෙදිපිළි කර්මාන්ත යැයි හඳුන්වනු ලැබේ). සැපයුම අංශයෙන්, අමු ද්‍රව්‍ය සුලභ දීම, වැඩි යහපත් කම්කරු සම්බන්ධතා යනාදී සාධක 1968 නිමවූ මේ සිවීමට බලපා ඇත. වර්ගය, කර්මාන්තය සහ ප්‍රධාන නිෂ්පාදන අනුව නිෂ්පාදන වටිනාකම පිළිබඳ II (ආ)2 සංඛ්‍යා සටහන, විශ්ලේෂණයෙහි ලා ප්‍රධාන වර්ධනයන් සතරක් II (ආ) 2 (1) අනාවරණය වෙයි.

පළමුවැන්න වනුයේ, සකස් කළ ආහාර කර්මාන්තයේ වාර්තාගත නිෂ්පාදන වටිනාකමෙහි රුපි. දශ ලක්ෂ 119.4 ක විශාල වැඩිවීමයි. දෙවැන්න වනුයේ එළවළු තෙල් සහ මේද රෙදිපිළි කැටීම, විවීම සහ නිමා කිරීම, විවිධ රසායනික නිෂ්පාදන, රබර් නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර සහ උපකරණ හැර නිම වූ ලෝහයෙන් කළ වෙනත් නිෂ්පාදිත ( මින් මතු නිම වූ ලෝහයෙන් කළ නිෂ්පාදිත ) සහ යන්ත්‍ර ( විදුලි යන්ත්‍ර හැර ) ප්‍රවාහන උපකරණ ( මින් මතු යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ) යන මේවායේ ඇති මද වැඩිවීමය. තුන්වැන්න, විස්කෝතු, කොකෝවා, චොකලට්, සහ රසකැවිලි ( මින්මතු විස්කෝතු සහ රසකැවිලි ) පාන වර්ග දුම්කොල, ගොතන ලද රෙදිපිළි සහ භාණ්ඩයන් සහ පාවහන් හැර සකසන ලද වෙනත් ඇඳුම් පැළඳුම් ( මින්මතු ඇඳුම් පැළඳුම් ) කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදන, ප්ලාස්ටික් නිෂ්පාදන, සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදන, ඇස්බෙස්ටෝස් නිෂ්පාදන, විදුලියෙන් ක්‍රියා කරන යන්ත්‍ර සූත්‍ර, මෙවලම් සහ උපකරණ සහ සැපයුම් ( මින්මතු විදුලියෙන් ක්‍රියා කරන යන්ත්‍ර ) යන මේවායේ සුළු වැඩිවීම් විය.

### සංඛ්‍යා සටහන II (ආ) 2(1)

නිෂ්පාදන වටිනාකම වැඩිවීම අනුව කර්මාන්තයන් වර්ග කිරීම

| 0 — රුපි. දශ ලක්ෂ 5 | රු. 5 — රුපි. දශ ලක්ෂ 20 | රු. 20 — රුපි. දශ ලක්ෂ 100 | රුපි. දශ ලක්ෂ 100 වැඩි |
|---|---|---|---|
| 1. සකස් කළ ආහාර | 1. විස්කෝතු සහ රස කැවිලි | 1. එළවළු තෙල් සහ මේද | 1. සකස් කළ ආහාර |
| 2. පාවහන් සහ සම් | 2. බීම වර්ග | 2. නූල් කැටීම සහ රෙදි විවීම | |
| 3. දව භාණ්ඩ හා තුනී ලැලි නිෂ්පාදනය | 3. දුම්කොළ | 3. විවිධ රසායනික නිෂ්පාදිත | |
| 4. කාර්මික රසායනික | 4. ඇඳුම් හා පැළඳුම් | 4. රබර් නිෂ්පාදිත | |
| 5. පිඟන් බඩු | 5. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 5. යකඩ සහ වානේ | |
| 6. වීදුරු සහ වීදුරු නිෂ්පාදන ගඩොල් සහ උළු | 6. ඛනිජ තෙල් සහ ගල් අඟුරු | 6. නිමගම් ලෝහ නිෂ්පාදිත | |
| 7. ඉල්මනයිට් | 7. ප්ලාස්ටික් නිෂ්පාදිත | 7. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | |
| | 8. සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් | | |
| | 9. විදුලිබලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර සූත්‍ර | | |

සතර වැන්න, ඉහත සඳහන් ඒ ඒ කාර්මික වර්ගයන්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රාසාරණය වන පසුබිමක මෙම කාලසීමාව තුලදී වැදගත් කාර්මික ගණ කීපයක් ම කාර්ය විරහිත වීමට නැඹුරු විය. ඒවා නම් කල් තබාගැනීම සඳහා පිළියෙල කරන ලද ටින්වල ඇසුරු පළතුරු, එළවළු, මස් සහ මාළු සහ වෙනත් මුහුදු ආහාර ( මින් මතු කල් තබා ගැනීම සඳහා පිළියෙල කළ ආහාර ) පාවහන් සහ සම් නිෂ්පාදිත, දැව හා තුනී ලෑලි කාර්මික රසායනික ද්‍රව්‍ය, පිඟන් බඩු, වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන්, ගඩොල්, උළු සහ ඉල්මනයිට්.

අළුත් ව්‍යාපාරික ආයතන හෝ අළුත් නිෂ්පාදිත, අපගේ සමීක්ෂණයට ඇතුළත් වී යයි සැලකිල්ලට ගත් කල, ඉහත දැක්වූ ඒ ඒ ව්‍යාපාරික ක්‍රියාකාරිත්ව මාර්ගයන්ගේ වර්ධනයේ ලා ඇතිවූ, දියුණුව හුදෙක් සංඛ්‍යා තොරතුරුමය කරුණක් බව නිසැකය. වාර්තා සපයන ව්‍යාපාරික ආයතනයන්ගේ සහ එක් එක් ප්‍රධාන කර්මාන්ත ගණයන්ගේ නිෂ්පාදන වටිනාකම පිළිබඳ වෙනස II (ආ) 2 (2) සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනය කොට දක්වා තිබේ.

### II (ආ) 2 (2) සංඛ්‍යා සටහන

**වාර්තා සපයන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව හා නිෂ්පාදන වටිනාකම**

| කර්මාන්ත ගණය | වාර්තා සපයන ව්‍යාපාරික ආයතනවල සංඛ්‍යාවේ වෙනස | නිෂ්පාදන වටිනාකමෙහි වෙනස රුපි. දශ ලක්ෂ |
|---|---|---|
| 1. ආහාර, බීම වර්ග සහ දුම්කොළ ... ... | — 234 | + 187.3 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තය ... | + 103 | + 47.2 |
| 3. දැව භාණ්ඩ ඇතුළුව, දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය | + 6 | + 6.5 |
| 4. කඩදසි සහ කඩදසි නිෂ්පාදිත ... ... ... | + 12 | + 19.9 |
| 5. රසායනික, ඛණිජ තෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ... ... ... | + 38 | + 66.6 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත* | — 8 | + 23.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත ... ... ... | + 1 | + 27.3 |
| 8. නිමගම් ලෝහ නිෂ්පාදිත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිමැයුම ... ... ... | + 70 | + 65.1 |
| 9. අන්තැනක නොසඳහන් නිමැයුම් නිෂ්පාදිත ... | — 14 | + 1.2 |

* ඛනිජ තෙල් හා ගල්අඟුරු හැර.

රෙදිපිළි කර්මාන්තයේ, වාර්තා සපයන ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 393 සිට 496 දක්වා වැඩි වූ අතර, මෙම ගණයේ වාර්තාගත නිෂ්පාදන වටිනාකම රුපියල් දශ ලක්ෂ 177.1 සිට රුපියල් දශ ලක්ෂ 224.3 දක්වා වැඩි විය. නිෂ්පාදන වටිනාකම ඉතාමත් ම අධික වූයේ ආහාර, පාන වර්ග, සහ දුම්කොළ ගණයේය. එහෙත්, මෙම ගණයට අයත්, වාර්තා සපයන ව්‍යාපාරික ආයතනයන්ගේ සංඛ්‍යාව 1967 දී 822 ව පැවතුණු අතර, 1968 දී 588 දක්වා සීඝ්‍රයෙන් පහත වැටුණි. මෙයට හේතු වූයේ සුළු ප්‍රමාණයේ බීඩි නිෂ්පාදකයන් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ඉවත්වීමයි. 1968 දී ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර දරන ඒ ඒ පුද්ගලයින්ගේ වෙන් කිරීම් අඩු කැරුණ අතර, අපගේ සමීක්ෂණයේ ආවරණ පරිපථයට හසු නොවන වෙනත් නිෂ්පාදන ඒකක 3000 ක පමණ අළුත් වෙන් කිරීම් දෙන ලදී. අතිශයින් ම වැදගත් වූ මෙම අමුද්‍රව්‍යවල සැපයුම කුඩා කෝවල වෙන්කිරීම් මගින් සීමා කිරීම නිසා සුළු ප්‍රමාණයේ නිෂ්පාදකයින් කීප දෙනෙකුටම නිෂ්පාදන ක්ෂේත්‍රයෙන් ඉවත්වීමට සිදුවිය. බීඩි කර්මාන්ත යේ වාර්තා සපයන ව්‍යාපාරික ආයතනයන්ගේ සංඛ්‍යාව පහත වැටී තිබියදීත්, දුම්කොල කර්මාන්තයේ වාර්තාගත නිෂ්පාදන වටිනාකම රුපි. දශ ලක්ෂ 18.5 ක ප්‍රමාණවත් වැඩිවීමක් දක්වාලිය. මෙයට බොහෝ සෙයින් ම හේතු වූයේ සිගරැට් නිෂ්පාදන කර්මාන්තයේ පෙණුනු වර්ධන ප්‍රවේගයයි. දැව සහ තුනී ලෑලි ගණයේ වාර්තා සපයන ව්‍යාපාරික ආයතනයන්ගේ සංඛ්‍යාව 14 සිට 20 දක්වා වැඩිවිය. මෙම වැඩිවීම නිෂ්පාදන වටිනාකමෙහි රුපි. දශ ලක්ෂ 6.5 ක වැඩිවීම ඇසුරු කැරිණි. එමෙන්ම රසායනික ඛනිජ තෙල්,

ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් ගණයේ ( මින් මතු රසායනික කර්මාන්ත ) තොරතුරු සපයන ව්‍යාපාරික ආයතනයන්ගේ සංඛ්‍යාව 246 සිට 284 දක්වා වැඩි වූ අතර එහි නිෂ්පාදන වටිනාකම රුපි. දශ ලක්ෂ 66.6 කින් ඉහළ ගියේය. රසායනික ගණයේ මෙම විශාල වැඩිවීම කර්මාන්ත යෙහි අනෙක් ශාඛාවන්හි සීඝ්‍ර වර්ධනය හා අනුබද්ධ වූවක් බව නිසැකය. සබන්, ගිනිපෙට්ටි, රෙදිපිළි වැනි නිෂ්පාදන ශාඛාවන් විසින් මෙන්ම ඖෂධීය ද්‍රව්‍ය, තීන්ත ප්‍රසාධන භාණ්ඩ පිළියෙල කිරීම්, කෘමිනාශක ද්‍රව්‍ය යනාදිය නිපදවන රසායනික කර්මාන්තයේ ඇතැම් ශාඛාවන් විසින් ද රසායනික ද්‍රව්‍ය භාවිතා කරන ලදී. ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ( ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ) ගණයේ ලා මේ වසර තුළදී වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතනයන්ගේ ගණන සුළු වූ මුත් මෙම ගණයේ වාර්තාගත නිෂ්පාදන වටිනාකම රුපි.දශ ලක්ෂ 23.3 කින් වැඩිවිය. මෙයට බොහෝ කොටම හේතු වූයේ එහි උපගණය වන සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන්ගි නිමැවුමෙහි ඇති වූ වැඩිවීමයි. මෙම උපගණය තුලත් ඇස්බැස්ටෝස් නිෂ්පාදනය, ගොඩනැගිලි කර්මාන්තයේ වර්ධනය සිදුවන වේගයෙන්ම වැඩි නොවිය. දේශීය උළු කර්මාන්තයෙහි සංවර්ධනයට අනුබලයක් දීම් වස් ඉහත කී ඇස්බැස්ටෝස් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සීමා කිරීම, සඳහා රජය විසින් හිතාමතාම අනුගමනය කොට ඇති ප්‍රතිපත්තිය මෙයට හේතුවිය.

සකස්කරන ලද ලෝහයෙන් කළ නිෂ්පාදනයන්, යන්ත්‍ර සූත්‍ර උපකරණ ගණයේ ලා වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතනයන්ගේ සංඛ්‍යාව මේ වසර තුලදී 70 කට වැඩිවූඅතර නිමැවුමේ වටිනාකම රුපි. දශ ලක්ෂ 65.1 කින් වැඩිවිය. මෙහි ප්‍රධාන උප ගණයට කටු කම්බි, කම්බි ඇණ, ගැල්ව නයිස් නිෂ්පාදිත යනාදිය අඩංගු වෙයි. මේ අනුව, මේ ගණයේ නිෂ්පාදන වටිනාකමේ වැඩිවීම මෑත වර්ෂවල දක්නට ලැබුණු ගොඩනැගිලි කටයුතුවල ඉහල නැගීම ඇසුරු කර සිදුවන්නට ඇත. මෙම කර්මාන්ත ගණයේ අනෙක් ඉංජිනේරු අංශයන්හි බෝට්ටු සඳහා නිපදවන ලද කොටස්, මහන යන්ත්‍ර, බයිසිකල්, කාර් යනාදිය වැනි විවිධ නිෂ්පාදිත විශාල ප්‍රමාණයක් ඇතුලත් විය.

1968 නිෂ්පාදන වටිනාකමෙහි මූර්ත වැඩිවීම පිළිබඳ ඇස්තමේන්තු සැකසීම් වස් 1968 දී නිෂ්පාදන වටිනාකම රුපි. පන් ලක්ෂය ඉක්ම වූ ව්‍යාපාරික ආයතනයන් 134 ක ආදර්ශක යන් යොදවා ගත් අතර මෙම කාලසීමාවේදී ඒවායේ නිෂ්පාදන ප්‍රමාණය සහ වටිනාකමේ වෙනස නිරීක්ෂණය කිරීම එහි අදහස විය. වසර දෙක අතර කාලසීමාවේ නිමැවුම් ප්‍රමාණයන් සැසඳීම හැමවිටම කළ හැකි නොවේ. ඊට හේතු වූයේ සෑම ව්‍යාපාරික ආයතනයක් විසින්ම එකම මිනුම් ඒකකයක් වර්ෂ දෙකෙහිදීම භාවිතා නො කිරීමත්, තොරතුරු සැපයීමට මුළුමනින්ම අපොහොසත් වීමත් නිසාය. සංසන්දනය අර්ථවත් වූ හැම තන්හිම කර්මාන්තයේ වැදගත් වර්ධන අංශයන්හි ආදර්ශක වේගය ඇති කරවන ව්‍යාපාරික ආයතනයන් කීපයෙහි ම 1968 දී විශාල නිමැවුම් ප්‍රමාණයක් ඇති වූ බැව් පෙනී ගියේය. මෙහිලා නිමැවුමෙහි වැඩිවීම් ප්‍රතිශත ප්‍රමාණ සැමවිටම මිල වැඩිවීම් පමණටත් වැඩිවිය. ආදර්ශයට ඇතුලත්වූ ආයතන සඳහා සියයට 34.2ක් ප්‍රධාන කර්මාන්ත ගණයන් අනුව වර්ග කරන ලද මෙකී ආදර්ශක ව්‍යාපාරික ආයතනවල නිෂ්පාදන වටිනාකමෙහි වෙනස්කම් II (ආ) 2 (3) සංඛ්‍යා සටහනින් දක්වෙයි. නිෂ්පාදන වටිනාකමේ මුළු ප්‍රතිශත වැඩිවීම සියයට 35.2 ක් වූ අතර වාර්තා සැපයූ සියළුම ව්‍යාපාරික ආයතනයන් සඳහා වූ එම සංඛ්‍යාව සියයට 46.6 ක් විය.

## II (ආ) 2 (3) සංඛ්‍යා සටහන

රුපියල් දහස් ගණනින්

| | 1967 | 1968 | % වැඩිවීම |
|---|---|---|---|
| 1. ආහාර, බීම වර්ග සහ දුම්කොළ ... ... | 93,047 | 145,955 | 56.9 |
| 2. රෙදිපිළි කර්මාන්තය ... ... ... | 100,197 | 114,993 | 14.8 |
| 3. දව සහ දව නිෂ්පාදිත ... ... ... | 2,711 | 6,257 | 130.8 |
| 4. කඩදසි සහ කඩදසි නිෂ්පාදිත ... ... | 25,288 | 30,960 | 22.4 |
| 5. රසායනික කර්මාන්තය ... ... | 105,375 | 138,805 | 31.7 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ... ... | 56,003 | 78,089 | 39.4 |
| 7. සකස්කරන ලද ලෝහමය නිෂ්පාදිත ... ... | 69,511 | 91,969 | 32.3 |
| 8. අන් තැනක සඳහන් නොවන, නිෂ්පාදිත ... | 528 | 678 | 28.4 |
| එකතුව ... | 452,660 | 607,706 | 34.3 |

## සංඛ්‍යා සටහන II (ආ) 3

## 1964–1968 කර්මාන්ත නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
| අ. පාරිභෝගික භාණ්ඩ ... | **340.1** | **456.9** | **480.3** | **528.9** | **694.8** | **63.3** | **53.9** | **56.5** | **55.4** | **49.7** |
| 1. ආහාරපාන හා දුම්කොළ ... | 133.0 | 143.9 | 144.0 | 185.7 | 238.4 | 24.8 | 17.0 | 16.9 | 19.5 | 17.0 |
| අ. ආහාර නිෂ්පාන ... | 36.0 | 28.0 | 30.9 | 33.7 | 40.8 | 6.7 | 3.4 | 3.6 | 3.5 | 2.9 |
| ආ. කල්තැබිය හැකි සහ ටින් වල අසුරන ලද පලතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර(2) | 3.8 | 5.4 | 5.1 | 6.7 | 8.4 | 0.8 | 0.6 | 0.6 | 0.7 | 0.6 |
| ඇ. විස්කෝතු සහ රසකැවිලි | 30.9 | 34.9 | 38.6 | 33.3 | 44.3 | 5.7 | 4.1 | 4.5 | 3.5 | 3.2 |
| ඈ. සිසිල් බීම ... | 13.4 | 16.0 | 11.6 | 14.5 | 17.3 | 2.5 | 1.9 | 1.4 | 1.5 | 1.2 |
| ඉ. අරක්කු, බීර, ස්ටවුට් යනාදිය (3) ... | 2.7 | 7.6 | 5.5 | 5.5 | 17.1 | 0.5 | 0.9 | 0.6 | 0.6 | 1.2 |
| ඊ. දුම්කොළ ... | 46.2 | 52.0 | 52.3 | 92.0 | 110.5 | 8.6 | 6.1 | 6.2 | 9.7 | 7.9 |
| 2. ඇඳුම් පැළඳුම් ... | 54.9 | 55.5 | 56.1 | 48.1 | 55.7 | 10.2 | 6.5 | 6.6 | 5.0 | 4.0 |
| 3. පාවහන් සහ සම්භාණ්ඩ ... | 23.4 | 24.7 | 27.7 | 31.9 | 32.4 | 4.3 | 2.9 | 3.3 | 3.3 | 2.3 |
| 4. විවිධ රසායනික භාණ්ඩ(5)... | 73.7 | 91.2 | 101.9 | 98.2 | 118.9 | 13.7 | 10.8 | 12.0 | 10.3 | 8.5 |
| 5. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (6) ... | 19.2 | 16.2 | 22.3 | 20.8 | 19.4 | 3.6 | 1.9 | 2.6 | 2.2 | 1.4 |
| 6. සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (7) ... | 9.2 | 9.0 | 7.7 | 7.7 | 9.1 | 1.7 | 1.0 | 0.9 | 0.8 | 0.7 |
| 7. ප්ලාස්ටික් භාණ්ඩ ... | 10.6 | 13.4 | 14.5 | 15.9 | 32.5 | 2.0 | 1.6 | 1.7 | 1.8 | 2.3 |
| 8. වීදුරු සහ වීදුරු භාණ්ඩ ... | — | — | — | — | 4.8 | — | — | — | — | 0.3 |
| 9. පිඟන් බඩු ... ... | 2.4 | 2.4 | 2.3 | 4.4 | 8.5 | 0.4 | 0.3 | 0.3 | 0.5 | 0.6 |
| 10. රබර් භාණ්ඩ (8) ... | 13.3 | 8.0 | 7.0 | 14.0 | 28.2 | 2.5 | 1.0 | 0.8 | 1.4 | 2.0 |
| 11. නූල් කැටීම, රෙදිපිළි වියීම හා නිම කිරීම ... ... | — | 91.3 | 95.1 | 97.1 | 136.2 | — | 10.8 | 11.2 | 10.2 | 9.7 |
| 12. දව නිෂ්පාදිත ... | — | — | — | 3.6 | 8.0 | — | — | — | 0.4 | 0.6 |
| 13. නිෂ්පාදන භාණ්ඩ (අන්තැනක සඳහන් නොවූ) (9) ... | 0.4 | 1.3 | 1.7 | 1.5 | 2.7 | 0.1 | 0.1 | 0.2 | 0.1 | 0.2 |
| ආ. අන්තර් භාණ්ඩ ... | **146.3** | **316.1** | **296.5** | **297.2** | **478.8** | **27.2** | **37.3** | **34.9** | **31.2** | **34.2** |
| 1. ආහාර නිෂ්පාදිතයන් (10) | 124.7 | 271.6 | 245.9 | 236.6 | 371.2 | 23.2 | 32.1 | 28.9 | 24.8 | 26.5 |
| 2. සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (11) ... | 4.9 | 9.3 | 8.5 | 8.5 | 8.9 | 0.9 | 1.1 | 1.0 | 0.9 | 0.6 |
| 3. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (12) ... | 10.9 | 13.1 | 11.5 | 13.9 | 35.2 | 2.0 | 1.5 | 1.4 | 1.5 | 2.5 |
| 4. තුනී ලෑලි ... ... | 3.9 | 5.2 | 6.5 | 6.8 | 8.9 | 0.7 | 0.6 | 0.8 | 0.7 | 0.6 |
| 5. ඉල්මනයිට් නිෂ්පාදිතයන් ... | 0.9 | 1.3 | 1.4 | 1.4 | 2.2 | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.2 |
| 6. කාර්මික රසායන (13) ... | 1.0 | 1.6 | 1.9 | 1.9 | 2.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| 7. විදුලි යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් උපකරණ ... | — | 14.0 | 20.8 | 28.1 | 41.8 | — | 1.6 | 2.4 | 3.0 | 3.0 |
| 8. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් ... | — | — | — | — | 8.3 | — | — | — | — | 0.6 |
| ඇ. ආයෝජන භාණ්ඩ ... | **51.1** | **74.0** | **73.5** | **128.1** | **225.0** | **9.5** | **8.7** | **8.6** | **13.4** | **16.1** |
| 1. සෑදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (14) ... | 24.4 | 26.4 | 32.8 | 37.9 | 61.5 | 4.5 | 3.1 | 3.8 | 4.0 | 4.4 |
| 2. රබර් භාණ්ඩ (15) ... | 3.7 | 11 1 | 11.9 | 6.7 | 13.0 | 0.7 | 1.3 | 1.4 | 0.7 | 0.9 |
| 3. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටොස් නිෂ්පාදිතයන් ... ... | 23.0 | 36 5 | 28.8 | 53.5 | 70.0 | 4.3 | 4.3 | 3.4 | 5.6 | 5.0 |
| 4. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ ... | — | — | — | 19.8 | 45.9 | — | — | — | 2.0 | 3.3 |
| 5. ගඩොල් සහ උළු ... | — | — | — | 10.2* | 7.3 | — | — | — | 1.1 | 0.5 |
| 6. යකඩ සහ වානේ (16) ... | — | — | — | — | 27.3 | — | — | — | — | 2.0 |
| එකතුව ... | 537.5 | 847.0 | 850.3 | 954.2 | 1398.6 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

* වීදුරු නිෂ්පාදන අඩංගුවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(1) කිරි නිෂ්පාදිත, අයිස්ක්‍රීම් සහ ලුණු, මාර්ජරීන් යනාදිය.
(2) ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පළතුරු වර්ග යනාදිය.
(3) අරක්කු නිෂ්පාදන සංඛ්‍යා 1968 වර්ෂයට පමණි.
(4) කමිස, බැනියම් යනාදිය
(5) හෛෂජ්ජීක ද්‍රව්‍ය, විලවුන්, සබන් වර්ග සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය.
(6) ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය.
(7) ඇලුමිණියම් භාජන.
(8) මෝටර් රථ සහ බයිසිකල් ටයර් සහ ටියුබ්, සෙල්ලම් භාණ්ඩ හා ගෘහෝපකරණ.
(9) සපත්තු පොලිෂ්, බුරුසු, සෙල්ලම් බඩු, කෘත්‍රිම රන්රිදී ආභරණ යනාදිය.
(10) ගව සහ කුකුල් ආහාර, එළවළු තෙල් වර්ග, අයිස්, කපාපු පොල් යනාදිය.
(11) භාජන.
(12) මුද්‍රණ කඩදාසි, කාට්න්, අනිකුත් ඇසුරුම් පෙට්ටි සහ ඔතන කඩදාසි.
(13) කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන්.
(14) කටුකම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් කළ භාණ්ඩ යනාදිය.
(15) ටයර් නැවත පිරවීම.
(16) රෝල් වානේ සහ කම්බි භාණ්ඩ.

## කර්මාන්ත කරනයෙහි ලා වෙනස් වෙමින් පවතින රටාව

II (ආ) 2 සංඛ්‍යා සටහන, තවදුරටත් විග්‍රහ කිරීමේ දී පෙනී යනුයේ, 1967 න් පසු කාර්මික කරණයේ ව්‍යුහයෙහි සහ රටාවෙහි මූලික වශයෙන් විශාල වෙනස්කම් සිදුවී නොමැති බවයි. ඉකුත් වර්ෂයේ දී මෙන් ම, ආහාර ද්‍රව්‍ය සකස් කිරීමේ කර්මාන්තය ඉතාමත් ම වැදගත් අංශය ලෙස තවදුරටත් පැවතුනි. ආහාර පාන, බීම වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයෙහි වටිනාකම, 1967 දී මෙන් ම 1968 වර්ෂයෙන් දී ද මුළු කාර්මික නිෂ්පාදන වටිනාකමින් සියයට 44 ක් විය. කෙසේ වුවද, 1964 වර්ෂයෙන් පසු, කාර්මීකරණ රටාවෙහි උපනතීන්වල වෙනසක් පෙන්නුම් කෙරේ. පළමු කර්මාන්ත ගණ දෙක, එනම්, ආහාර, බීම වර්ග හා දුම්කොළ සහ රෙදිපිළි, මේ කාලජේදය තුළ දී පහත වැටීමේ උපනතියක් දක් වූ අතර, අන්තිම ගණ තුන, එනම්, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන, මූලික හා නිමවි ලෝහ භාණ්ඩ ඒවායේ සාපේක්ෂ වැදගත්කම වැඩි කොට ගෙන ඇත. ආහාර ද්‍රව්‍ය සකස් කිරීමේ කර්මාන්තයන් හී සාපේක්ෂ වැදගත් කම 1964 දී පැවැති කොටස් වලින් අඩක් පමණවන තෙක් පහළ වැටී ඇති අතර, රෙදිපිළි කර්මාන්ත යේ කොටස ද, එහි පෙර පැවැති ප්‍රමාණයට වඩා සියයට 90 ක් පමණ දක්වා අඩු වී ඇත. අනික් අතින් බලන කල, මූලික සහ නිමවි ලෝහ නිෂ්පාදන ගණයන් හී සාපේක්ෂ වැදගත්කම 1964 දී සියයට 7.2 සිට 1968 දී සියයට 14.0 දක්වා ඉහළ ගොස් ඇත. මේ අනුව කාර්මික වෘද්ධියෙහි ලා ලෝහ නිෂ්පාදිත ගණයන්, ඉතාමත් ගතික අංශයන්ව පැවතුණි.

කර්මාන්තයෙහි, ගණය සහ ප්‍රධාන නිෂ්පාදිතයන් අනුව කාර්මික නිෂ්පාදනයෙහි වටිනාකම විශ්ලේෂණය කොට ඇති II (ආ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි ද, මෙකී පුළුල් වෙනස්වීම් දක්වා ඇත. 1964 දී පාරිභෝජන භාණ්ඩ යනුවෙන් පුළුල් වශයෙන් හඳුන්වා ඇති කර්මාන්තයන්හී, නිපැයුමේ වටිනාකම කාර්මික නිෂ්පාදනයේ මුළු වටිනාකමින් සියයට 63.3 ක් ද, ගොඩනැගිලි සඳහා අවශ්‍ය වන ද්‍රව්‍යයන්, ලෝහ සහ උපකරණයන් අඩංගු වන පරිදි ඉතාමත් පුළුල් වශයෙන් ආයෝජන භාණ්ඩ යනුවෙන් හඳුන්වා ඇති කර්මාන්තයන්හී නිෂ්පාදනය, මුළු කාර්මික නිෂ්පාදිත වටිනාකමින් සියයට 10 ක්, වූ අතර, 1968 වර්ෂයේ දී පාරිභෝගික භාණ්ඩ ගණයේ නිපැයුමෙහි ප්‍රතිශත වටිනාකම තියුණු ලෙසින් සියයට 49.7 දක්වා පහත වැටී ඇත. අනික් අතින් බලන කල්හී, ආයෝජන භාණ්ඩ ගණයේ නිපැයුමේ වටිනාකම සියයට 16.1 කින් ඉහළ ගොස් ඇත. කාර්ීකරණයේ දී, කාර්මික නිෂ්පාදන රටාවෙහි වෙනස්කම් සිදු වන්නේ ය. කාර්මී කරණය, අවස්ථා අනුව ඉදිරියට යත් ම, ප්‍රාග්ධන භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය සහ කල් පවතින පාරිභෝගික භාණ්ඩ යනාදියට ඇති ඉල්ලුමෙහි සාපේක්ෂ වශයෙන් සීඝ්‍ර වර්ධනයක් සහ ආහාර, රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් සඳහා ඇති ඉල්ලුමෙහි සාපේක්ෂ වශයෙන් මඳ වැඩිවීමක් ඇති වීම සාමාන්‍යයෙන් ඇති වන වෙනස්කම් ය. කාර්මීකරණයෙහි විවිධ අවස්ථාවන්හිදී නිමැයුම් රටාවෙහි මෙකී වෙනස්කම් කෙරෙහි ඉල්ලුමට අමතරව වෙනත් සාධකයන්ද වගකිව යුතු වන්නේ ය. මුල් අවස්ථාවේදී, පාරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය සරල නිෂ්පාදන ක්‍රමයන් සහ මඳ ශිල්පීය දැනුමක් අවශ්‍ය නිෂ්පාදන ක්‍රම පමණක් අනුගමනය කෙරෙනු ලබන අතර, එයින් පාරිභෝජන භාණ්ඩ රාශියක් නිපදවීමට හැකි වනු ඇත. දිගු කල් නොගොස්ම ප්‍රශස්ත ප්‍රමාණයේ රසායනික ද්‍රව්‍ය සහ ප්‍රාග්ධන භාණ්ඩ නිපදවන ව්‍යාපාරික ආයතනයන් කාර්මික ක්ෂේත්‍රයෙහි ඇරඹෙනු ඇත. වෙළෙඳපල ප්‍රසාරණය වීම, කාර්මික ශිල්පීය වෙනස් කම් සහ කාර්මික ශිල්පීය පුහුණුවෙහි දියුණුව විසින් මෙකී උපනතිය වේගවත් කෙරෙයි. පුළුල් ලෙස බලන කල, මෙම වර්ධනය, පාරිභෝජන මධ්‍යස්ථානවලට ආසන්නව කර්මාන්ත ශාලා පිහිටුවීමට ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන සංවිධාන පෙළඹවන ආර්ථික හා දේශ පාලන සාධකයක් වශයෙන් සැලකිය හැකි ය. ඇත්ත වශයෙන් ම, විදේශීය ව්‍යාපාරික ආයතන-වල දේශීය ශාඛා, 1968 දී උසස් වෘධි ප්‍රවේගයක් කාර්මික අංශය වෙත සැපැයූ බව සමීක්ෂණයෙන් හෙළි වේ.

කාර්ීකරණයෙහි ව්‍යුහය සහ රටාව පිළිබඳ වූ ඉහත සඳහන් විග්‍රහය තුලින් නිගමනයන් දෙකක් කරා එළඹිය හැකි වෙයි. පළමු වැන්න, සකස් කරණ ලද ලෝහ නිෂ්පාදිතයන්, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ සහ විදුලි යන්ත්‍රෝපකරණ කාර්මික වර්ධනයෙහි ඉතාමත් ගතික අංශයන් වීමය. දෙවැන්න කාර්මික වර්ධන රටාව පාරිභෝගික භාණ්ඩ නිපදවීමේ සිට ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තයන් කරා යොමු වීමය.

## කාර්මික ඒකකයෙහි ප්‍රමාණය

නිමැවුමෙහි වටිනාකම සහ වැටුප් වියදම අනුව කාර්මික සමාගම්වල විශාලත්වය බෙදී ගිය අයුරු පිළිවෙලින් II (ආ) 4 සහ II (ආ) 5 සංඛ්‍යා සටහන් වලින් දක්වේ.

ඉකුත් වර්ෂයේ දී මෙන් ම, පාරිභෝජන භාණ්ඩ නිෂ්පාදන අංශයෙහි කුඩා පරිමානයේ කර්මාන්තයන් සංකේන්ද්‍රණය වී තිබූ අතර කෝපි, සහ මිරිස් සහ තුනපහ කුඩු, මැකරෝනි, නූල්ඩ්ස් සහ ස්පැගටි, පපඩම් යනාදිය සහ ගෙතූ සහ මැසූ ඇඳුම් යනාදියෙහි ප්‍රධාන සැපයුම්කරු වූයේ ය. දුම්කොළ කර්මාන්තය සම්බන්ධයෙන් බලන කල, ආනයන සලාක ප්‍රමාණය අඩු කිරීම කාර්මික ඒකකයන් හී දුවටුම් කොළ හිඟයක් ඇති කෙළේ ය. නොවැලැක්විය හැකි ප්‍රතිඵලය වූයේ වැදගත් වූ මෙම අමු ද්‍රව්‍ය සඳහා කළුකඩයක් ඇතිවීමයි. එහෙයින් සුළු ව්‍යාපාරිකයනට, බීඩි නිෂ්පාදනයේ යෙදීම වෙනුවට තම අමු ද්‍රව්‍ය සලාක විකිණීම වඩා ලාභදායී විය. එහෙයින් නව සලාක පිළිවෙත සුළු ව්‍යාපාර දුර්වල කළ අතරම, මහා පරිමානයේ ආනයනයන් ගේ වර්ධනය කෙරෙහි හිතකර විය. විශාලම ව්‍යාපාරික ආයතනයන් හතෙකි. නිෂ්පාදනය 1967 දී මුළු බීඩි නිෂ්පාදනය වටිනාකමින් සියයට 25.9 ක් වූ අතර, 1968 දී මුළු වටිනාකම සියයට 41.6 දක්වා වැඩි වූ බැව් ලංකා මහ බැංකුවේ සමීක්ෂණයෙන් පෙන්නුම් කෙරෙයි.

### සංඛ්‍යා සටහන II (ආ) 4

### 1968 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදී ගිය අයුරු — නිමවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම් වටිනාකම රුපි. 250 දහසට අඩු | රු. 250 දහස්–රුපි. දශ ලක්ෂ 2 අඩු | රුපි. දශ ලක්ෂ 2 හා ඊට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| 1. ආහාර පාන වර්ග සහ ... | සමාගම් ගණන | 479 | 83 | 26 | 588 |
| දුම්කොළ නිෂ්පාදනය ... | නිමැවුමේ % ගණන | 51.3 | 9.4 | 29.3 | 100.0 |
| 2. රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ ... | සමාගම් ගණන | 398 | 83 | 15 | 496 |
| සම්භාණ්ඩ කර්මාන්තය ... | නිමැවුමේ % ගණන | 13.8 | 21.6 | 64.6 | 100.0 |
| 3 දුව, සහ දුව භාණ්ඩ ... | සමාගම් ගණන | 14 | 4 | 2 | 20 |
| (ගෘහ භාණ්ඩ ඇතුළුව) ... | නිමැවුමේ % ගණන | 4.8 | 11.2 | 84.0 | 100.0 |
| 4. කඩදසි සහ කඩදසි ... | සමාගම් ගණන | 58 | 29 | 3 | 90 |
| භාණ්ඩ නිෂ්පාදනය ... | නිමැවුමේ % ගණන | 9.7 | 48.9 | 41.4 | 100.0 |
| 5. රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් ... | සමාගම් ගණන | 206 | 59 | 19 | 284 |
| භාණ්ඩ නිෂ්පාදනය ... | නිමැවුමේ % ගණන | 11.8 | 19.4 | 68.8 | 100.0 |
| 6. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත යන් (පෙට්‍රෝලියම් සහ ... | සමාගම් ගණන | 36 | 11 | 6 | 5 |
| ගල් අඟුරු හැර) ... | නිමැවුමේ % ගණන | 3.4 | 9.1 | 87.5 | 100.3 |
| 7. මූලික ලෝහ ... | සමාගම් ගණන | — | — | 1 | 1 |
| නිෂ්පාදිතයන් ... | නිමැවුමේ % ගණන | — | — | 100.0 | 100.0 |
| 8. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර ... | සමාගම් ගණන | 154 | 74 | 25 | 253 |
| සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය ... | නිමැවුමේ % ගණන | 9.2 | 33.5 | 57.3 | 100.0 |
| 9. නිෂ්පාදිත භාණ්ඩ ... | සමාගම් ගණන | 15 | 4 | — | 19 |
| (අන් තැනක සඳහන් නොවන) | නිමැවුමේ % ගණන | 29.6 | 70.4 | — | 100.0 |
| එකතුව ... | සමාගම් ගණන | 1360 | 347 | 97 | 1804 |
| ... | නිමැවුමේ % ගණන | 28.1 | 17.2 | 54.7 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (අ) 4 (1)

## තෝරාගත් ව්‍යාපාරික ආයතනවල සේවා නියුක්තිය, වැටුප් වැය සහ නිෂ්පාදන වටිනාකම

| | සමාගම් ගණන (1) | සේවා නියුක්තිය (2) | වැටුප් වැය රු. දහස් (3) | නිෂ්පාදිතයේ වටිනාකම රු. දහස් (4) | නිෂ්පාදිතයේ මුළු වටිනාකමෙන් (4) %ට ගණන වශයෙන් |
|---|---|---|---|---|---|
| 1. විවිධ ආහාර නිෂ්පාදිතය ... | 10 | 3,409 | 7,186 | 80,615 | 32.2 |
| 2. එළවළු, තෙල් සහ මේද ... | 7 | 2,824 | 11,961 | 19,010 | 11.7 |
| 3. කල්තබාගත් සහ ටින්වල ... ඇසුරු ආහාර ... | 4 | 273 | 322 | 5,018 | 59.5 |
| 4. විස්කෝතු සහ රසකැවිලි ... | 5 | 866 | 1,074 | 29,818 | 67.3 |
| 5. සිසිල් බීම ... ... | 7 | 1,746 | 5,744 | 28,796 | 83.8 |
| 6. දුම්කොළ ... ... | 8 | 5,260 | 9,106 | 92,454 | 83.7 |
| 7. ඇඳුම් සහ පැළඳුම් ... | 10 | 1,601 | 2,181 | 17,962 | 32.2 |
| 8. නූල් කැටීම සහ රෙදිපිළි විවීම | 11 | 4,159 | 11,268 | 87,470 | 64.2 |
| 9. සපත්තු සහ හම් ... | 4 | 2,090 | 5,488 | 23,909 | 73.8 |
| 10. දැව නිෂ්පාදිත ... ... | 3 | 1,238 | 2,999 | 5,408 | 67.3 |
| 11. කඩදාසි සහ කඩදාසි බෝඩ ... | 13 | 2,209 | 6,277 | 37,247 | 68.2 |
| 12. විවිධ රසායනික ද්‍රව්‍ය ... ... | 15 | 3,016 | 13,944 | 94,823 | 79.7 |
| 13. ඛනිජ තෙල් සහ ගල් අඟුරු... නිෂ්පාදිත ... ... | 3 | 347 | 3,301 | 8,265 | 100.0 |
| 14. රබර් නිෂ්පාදිත ... ... | 4 | 1,738 | 5,351 | 31,713 | 76.8 |
| 15. ප්ලාස්ටික් නිෂ්පාදිත ... | 7 | 930 | 912 | 13,201 | 40.6 |
| 16. වීදුරු සහ වීදුරු නිෂ්පාදිත ... | 2 | 558 | 765 | 3,842 | 80.0 |
| 17. සිමෙන්ති සහ ඇස්බැස්ටෝස් | 2 | 1,894 | 8,532 | 65,476 | 93.5 |
| 18. ගඩොල් සහ උළු ... | 3 | 929 | 1,999 | 5,208 | 71.1 |
| 19. ලෝහ නිෂ්පාදිත ... | 23 | 3,569 | 8,154 | 56,736 | 71.4 |
| 20. යන්ත්‍ර සහ ප්‍රවාහණ උපකරණ | 12 | 3,055 | 6,862 | 36,150 | 78.8 |
| 21. විදුලි යන්ත්‍ර ... ... | 11 | 1,194 | 2,663 | 31,726 | 75.8 |
| එකතුව ... ... | 164 (9.1*) | 42,905 (42.3*) | 116,089 (61.6*) | 774,847 | 55.4 |
| මුළු එකතුව ... | 1,804 | 101,348 | 188.4† | 1398.6† | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* මුළු එකතුවෙහි සියයට ගණන වශයෙන්

† දශ ලක්ෂ

II (ආ) 4 සංඛ්‍යා සටහනට අනුව වාර්ෂික මුළු නිමැවුම රුපි. දශ ලක්ෂ 2 කට වැඩි ව්‍යාපාරික ආයතන 97 ක් විය. මෙම ව්‍යාපාරික ආයතනයන් 97 හි මුළු නිෂ්පාදිතය රු. දශ ලක්ෂ 722 කට ආසන්න වූ අතර, මුළු නිෂ්පාදිත වටිනාකමින් සියයට 54.7 ක් විය. අනිත් අතින් බලන කල 1967 දී නිමැවුම රුපි. දශ ලක්ෂ 2 කට වැඩි වූ ව්‍යාපාරික ආයතනයන් 59 ක් පැවැති අතර, මුළු නිෂ්පාදනයෙහි ලා ඒවායේ සාපේක්ෂ කොටස මීට වඩා වැඩි වූයෙන්, සියයට 67 කට ආසන්න විය. එසේම, රුපියල් 2,50,000 සිට රුපි. දශ ලක්ෂ 2 දක්වා ප්‍රමාණයක මුළු නිමැයුමක් ඇති ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව ද 1967 දී සියයට 25.3 සිට 1968 දී සියයට 17.2 දක්වා අඩු වී ගියේය. ඒ අනුව, මුළු නිමැවුමෙහි, කුඩා ව්‍යාපාර ආයතනවල සාපේක්ෂ කොටස 1967 දී සියයට 8.3 සිට 1968 දී සියයට 28.1 දක්වා ඉහළ ගියේ ය. එසේ වුවද, ඇතැම් කර්මාන්ත ගණවල ව්‍යාපාරික ආයතනයන් කිහිපයක් වෙත නිෂ්පාදනය සංකේන්ද්‍රනයවී යැමෙහි ප්‍රමාණය, මෙකී සංඛ්‍යා තොරතුරුවලින් පෙන්නුම් කර තිබෙනවාට වඩා වැඩි වනු ඇත.

අප විසින් දේශීය කර්මාන්තයන් ගේ කතිපයාධිකාරී ස්වභාවය පෙන්වීම සඳහා නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ වැටුප් පිළිබඳ තොරතුරු II (ආ) 4 (1) සංඛ්‍යා සටහනෙහි එක් රැස් කොට ඇත. මහා පරිමාණ නිෂ්පාදනයෙහි සැලකිය යුතු කොටසක් විශේෂිත වූ භාණ්ඩ ආනයන කරනු ලබන විශේෂිත කර්මාන්තයන් කෙරෙහි සංකේන්ද්‍රයණය වී ඇති බැව් දැකිය හැකි ය. රාජ්‍ය අංශයෙහි විශාල ඒකකයන් අත්හැරි කල, විශාලතම ව්‍යාපාරික ආයතනයන් පහත සඳහන් කර්මාන්තයන් හී පැවතුනි. සිසිල් බීම සහ අංගාරික ජලය, බිර සහ ස්ටවුට්, ඇස්බැස්ටෝස්, පාවහන් සහ සම්, විදුලි යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, රබර් නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිතයන්, රබර් භාණ්ඩ කර්මාන්තයෙහි මුළුනිෂ්පාදිතයෙන් සියයට 76.8 ක් ම, ව්‍යාපාරික ආයතනයන් හතරක් විසින් නිපැයනු ලැබයි. සිසිල් බීම සහ අංගාරික ජලය නිපදවනු ලබන කර්මාන්තයන් හී සංකේන්ද්‍රණයේ ප්‍රමාණය ඊටත් වඩා වැඩි වීය. මෙම අංශයෙහි නිපැයුමෙන් සියයට 89.5 ක්, කර්මාන්ත ආයතන හතරක් විසින් නිපදවනු ලැබේ. වෙනත් කර්මාන්තයන් කිහිපයක ම මෙම වර්ධනය වීමේ ක්‍රියාවලිය ස්ථානගතවීම සිදු වී ඇත. පාවහන් සහ හම් නිෂ්පාදිත කර්මාන්තයන් නිදසුනක් වශයෙන් ගත් කළ මුළු නිෂ්පාදනයෙන් සියයට 74 ක් ම ව්‍යාපාරික ආයතන 4 ක් මගින් සැපැයුන අතර, සෙසු ව්‍යාපාරික ආයතනයන් තුනෙහිම නිෂ්පාදනය හා තරමම ප්‍රමාණයක් ඉන් එක් ව්‍යාපාරික ආයතනයක් විසින් නිපදවනු ලැබෙයි. කාර්මික නිෂ්පාදනයෙන් සියයට 55.4 ක් ද, මුළු සේවා නියුක්තියෙන් සියයට 41.3 ක් ද, මුළු වැටුප් ප්‍රමාණයෙන් සියයට 61.6 ක් ද, අපගේ නියැදි සමීක්ෂණයට ඇතුළත් වූ ව්‍යාපාරායතන 164 ක් වෙත පැවරිය හැකි කර්මාන්ත ගණයන් කිහිපයක් ම, කර්මාන්ත තුළ නිෂ්පාදන ක්‍රම සහ කාර්මික ශිල්පීය හැඩ ගැසීම්වල ස්වභාවය මහා පරිමාණ නිෂ්පාදන කටයුතු කෙරෙහි හිතකර බවක් දැක් වීය. සමහර කර්මාන්තයන් හී, විශේෂයෙන් ම රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි, නිෂ්පාදිත ක්‍රියාවලියෙන් ප්‍රතිබද්ධ භාණ්ඩ නිෂ්පාදනය සිදු වේ. කර්මාන්තයන් විසින් ප්‍රශස්ත ලාභාංශ ලබා ගැනීම සඳහා ව්‍යාපාර ආයතන විසින් තම කටයුතු නව මාර්ග කරා යොමු කල යුතුය. මේ අනුව, නිෂ්පාදනය කිරීමේ පරිමාව විශාල වූ අතර, මෙම කර්මාන්තයන්හී වූ උපනතිය මහා පරිමාන නිෂ්පාදනය කෙරෙහි වීය.

II (ආ) 5 සංඛ්‍යා සටහන විශාලත්වය අනුව, ව්‍යාපාරායතනයන් හී ව්‍යාප්තිය පෙන්නුම් කිරීමේ මෙකී හැදෑරීම සම්පූර්ණ කිරීමට උපකාරී වෙයි. බලාපොරොත්තු විය හැකි පරිදි, ව්‍යාපාරායතනවල විශාලම සංඛ්‍යානය මුළු වැටුප් බිල රු. 15,000 ට අඩු ගණයේ වීය. එසේ වුවද, එම කර්මාන්තයන්හී වැටුප් වියදම, මුළු වැටුප් බිලෙන් සියයට 31 ක් පමණි. අනික් අතින් බලන කල, මුළු වැටුප් වියදම රු. 50,00,000 වූ ගණයෙහි මුළු ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 56 ක් පමණක් වන නමුත්, එම ආයතනවල වැටුප් වියදම, සංඛ්‍යා සැපැයූ වාර්තාගත වී ඇති සියළු ම ව්‍යාපාරික ආයතනවල ගෙවූ මුළු වැටුප් ප්‍රමාණයෙන් සියයට 63 ක් වීය.

සේවා නියුක්තියෙහි ප්‍රමාණය සහ නිෂ්පාදිත ප්‍රමාණය අනුව මැණෙන අයුරු මහා පරිමාන කර්මාන්තයන් හී ප්‍රමුඛ බව පෙන්නුම් කෙරේ. සවිස්තරාත්මක විග්‍රහයකින් පමණක් හෙළි වන කාර්මික ආයතනයන් හී විශාලත්වය අනුව ව්‍යාප්තියෙහි ඉතාමත් කැපී පෙනෙන ලක්ෂණ වූයේ සමහර වැදගත් කර්මාන්ත අංශයන්හී සුළු පරිමාන ව්‍යාපාරික ආයතනයන්හට තැනක් නැතිව යැමේ ප්‍රවනතාවයයි. මහා පරිමාන ව්‍යාපාරික ආයතනයන් ගේ වර්ධනයට හිතකර වූ ප්‍රතිපත්ති විධිවිධානවල මතු වූ ප්‍රතිඵලයක් වශයෙන් බීඩි කර්මාන්තයේ මෙය සිදු වීය. රසායනික ද්‍රව්‍ය නිෂ්පාදිත කර්මාන්තයන් හී එය සිදුවීමට හේතු වූයේ, මහා පරිමාන ව්‍යාපාර ආයතනවල වර්ධනයට තුඩු දුන් කාර්මික ශිල්පීය පරිමාණානුකූල පිරිවැසුම් වීය.

## අමු ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම

1967 වර්ෂයේ දී වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන 563 හා සසඳන කල්හී, 1968 දී ව්‍යාපාරික ආයතන 1,298 ක් අමු ද්‍රව්‍ය පාවිච්චිය සහ ඒවා ලබාගත් ආකාරය පිළිබඳ සංඛ්‍යා තොරතුරු සපයා දී ඇත. මෙකී සංඛ්‍යා තොරතුරු II (ආ) 6 සංඛ්‍යා සටහනෙහි වර්ග කොට දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II (ආ) 5

### 1968 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදී ගිය අයුරු — වැටුප් වැය පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. 15 දහස දක්වා | රුපි. 15 දහස — 50 දහස | රුපි. 50 දහස — 500 දහස | රුපි. 500 දහසට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය ... ... | සමාගම් ගණන | 235 | 75 | 61 | 14 | 385 |
| | වැටුප් වැයේ % ගණන | 2.6 | 4.3 | 16.5 | 76.6 | 100.0 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත ... | සමාගම් ගණන | 222 | 189 | 75 | 10 | 496 |
| | වැටුප් වැයේ % ගණන | 3.7 | 11.0 | 38.0 | 47.3 | 100.0 |
| 3. දැව සහ දැව භාණ්ඩ ( ගෘහ භාණ්ඩ ඇතුළුව) ... ... | සමාගම් ගණන | 5 | 9 | 4 | 2 | 20 |
| | වැටුප් වැයේ % ගණන | 0.6 | 4.3 | 7.5 | 87.6 | 100.0 |
| 4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය ... ... | සමාගම් ගණන | 38 | 32 | 18 | 2 | 90 |
| | වැටුප් වැයේ % ගණන | 3.5 | 9.5 | 30.2 | 56.8 | 100.0 |
| 5. රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය ... ... | සමාගම් ගණන | 146 | 71 | 55 | 12 | 284 |
| | වැටුප් වැයේ % ගණන | 6.1 | 6.5 | 20.6 | 66.8 | 100.0 |
| 6. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් ( පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර ) ... ... | සමාගම් ගණන | 21 | 9 | 18 | 5 | 53 |
| | වැටුප් වැයේ % ගණන | 0.8 | 1.7 | 15.8 | 81.7 | 100.0 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිතයන් ... ... ... | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුප් වැයේ % ගණන | — | — | — | 100.0 | 100.0 |
| 8. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය | සමාගම් ගණන | 68 | 84 | 91 | 10 | 253 |
| | වැටුප් වැයේ % ගණන | 1.8 | 8.7 | 47.6 | 41.9 | 100.0 |
| 9. නිෂ්පාදිත භාණ්ඩ ( අන්තැනක නොසඳහන් ) ... ... | සමාගම් ගණන | 11 | 4 | 4 | — | 19 |
| | වැටුප් වැයේ % ගණන | 16.4 | 16.2 | 67.4 | — | 100.0 |
| එකතුව ... ... ... ... | සමාගම් ගණන | 746 | 473 | 326 | 56 | 1601 |
| | වැටුප් වැයේ % ගණන | 3.1 | 6.9 | 27.3 | 62.7 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

වාර්තා කරනු ලැබූ ව්‍යාපාරික ආයතනයන් ප්‍රයෝජනයට ගනු ලැබූ අමු ද්‍රව්‍ය ප්‍රමාණයෙහි මුළු වටිනාකම රුපි. දශ ලක්ෂ 427.7 ක් වන අතර, මින් රුපි. දශ ලක්ෂ 152.0 ක් හෝ සියයට 35.5 ක් විදේශීය අමු ද්‍රව්‍ය යටතේ ද, රුපි. දශ ලක්ෂ 275.7 ක් හෙවත් සියයට 35.5 ක් විදේශීය අමු ද්‍රව්‍ය යටතේ ද වර්ග කොට දක්වා ඇත. පහත සඳහන් කර්මාන්ත ගණයන් හී විදේශීය අමු ද්‍රව්‍ය සංයුතිය ඉතා අධිකය. මූලික ලෝහ නිෂ්පාදිතයන් ( සියයට 96.3 ) නිම වී, ලෝහ නිෂ්පාදිත ( සියයට 84 ), ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත ( සියයට 79 ) කඩදසි සහ කඩදසි නිෂ්පාදන ( 67.1% ) සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදිත ( සියයට 62.4 ), ලී සහ ලී නිෂ්පාදිතයන් අත්හැරුන කල, සෙසු කර්මාන්තයන් සියල්ලක ගේ ම විදේශ අමු ද්‍රව්‍ය සංයුතිය සියයට 40 ට වඩා වැඩි විය. එමෙන් ම, විදේශීය අමු ද්‍රව්‍යවල විනිමය වටිනාකමට නිෂ්පාදිත වටිනාකමෙහි ඇති අනුපාතය සමහර කර්මාන්ත ගණයන්හි අධික වී තිබේ. එම අනුපාතයන් පහත දැක්වෙයි. මූලික ලෝහ නිෂ්පාදිතයන් සියයට 68.3, නිම වූ ලෝහ නිෂ්පාදිතයන් සියයට 49.8, කඩදසි සහ කඩදසි නිෂ්පාදිතයන් සියයට 35.8 සහ රෙදිපිළි කර්මාන්තය සියයට 32.1.

දේශීය කර්මාන්තයෙහි ලා විදේශීය අමු ද්‍රව්‍ය සංයුතිය වැඩිවීමෙන් අදහස් වනුයේ කර්මාන්ත වර්ධන අනුපාතයේ වෙනස්වීම්වලට වෙනත් කරුණු අතර, විදේශීය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව ද අදල වන බව ය. 1968 කර්මාන්ත නිෂ්පාදනයේ විශාල වැඩිවීමට බොහෝ දුරට හේතු වූයේ, දේශීය කර්මාන්ත ව්‍යාපාරිකයනට වඩා ලිහිල් විදේශීය විනිමය වෙන් කිරීම් ලබා දීම සඳහා වූ ප්‍රතිපත්ති මාර්ගයන් ගේ ප්‍රතිවිපාකයන් වශයෙනි.

මෙම වාර්තාවෙහි වෙනත් තැනක සඳහන් කොට ඇති පරිදි සියළු ම නිෂ්පාදන කර්මාන්ත යන්හිම වාගේ නිෂ්පාදන වටිනාකමෙහි ප්‍රමාණවත් වැඩි වීමක් ඇති වූයේ, 1968 වර්ෂයෙහි දෙ වන භාගයේ දී, වි. වි. හි. ස. ක්‍රමය ඇරඹීමෙන් පසුවය.

## සේවා නියුක්තිය

අපගේ සමීක්ෂණයට ඇතුළත් වූ ව්‍යාපාරික ආයතනයන්හී කාර්මික සේවා නියුක්ති පුද්ගල සංඛ්‍යාව 1,01,348 ක් වීය. මෙය ඉකුත් වසරට වඩා 27,393 ක වැඩිවීමකි. නිෂ්පාදනයෙහි ලා ශ්‍රමසූක්ෂම කර්මාන්ත ගණයන් ඇතුළත් වන පරිදි මෙම වසරේ සමීක්ෂණය පුළුල් වූ හෙයින්, මෙකී වැඩිවීම තරමක් දුරට සංඛ්‍යාත්මක වෙයි. ආහාර, බීම වර්ග සහ දුම්කොළ ගණයේ සේවා නියුක්තිය 1967 දී 26,401 ක් ව පැවැති අතර, 1968 දී 24,878 දක්වා සීඝ්‍රයෙන් පහත වැටුනි. එසේ වුවද, නිෂ්පාදනයේ විශාලතම වැඩිවීම වාර්තාගත වූයේ ද මෙම ගණයෙහි ය. මෙකී විචල්‍යතාවයන් දෙකෙහි පෙනී යන පරස්පර සංචලනයට බොහෝ දුරටම හේතු වූයේ නිෂ්පාදනයේ ශ්‍රම සූක්ෂමත්වයක් ඇති දුම්කොළ කර්මාන්තයට අයත්, ව්‍යාපාරික ආයතන අතුරින් වාර්තා සැපැයූ ව්‍යාපාරික ආයතනයන් ගේ ගණන සීඝ්‍ර ලෙස පහත වැටීමයි. මෙම කර්මාන්ත ගණයේ එක් සේවකයකුට අදල මිනිස්දින ගණන 275 සිට 286 දක්වා වැඩි වුන බවටත්, එමගින් ගණය තුල වූ සේවා නියුක්තියේ සැලකිය යුතු අඩුවීම තරමක් දුරට කැපී ගිය බවත් සැලකිය යුතු ය. මේ අනුව, මෙම ගණයේ මුලු මිනිස්දින ගණන අඩු වී ඇත්තේ 1,29,000 කින් පමණි. විශාලතම සේවා නියුක්තියක් පෙන්නුම් කළ කර්මාන්තයන් වූයේ රෙදිපිළි සහ නිමවී ලෝහ ගණයන් ය. පළමුව කී ගණයෙහි මුළු නිෂ්පාදන වටිනාකමෙහි ඇති වූ රුපි. දශ ලක්ෂ 47.2 කේ වැඩිවීම කර්මාන්තයේ මුළු සේවක සංඛ්‍යාවෙහි ඇති වූ අතිරේක සේවක සංඛ්‍යාව 15,476 කින් හෙවත් සියයට 56.5 කින් වැඩිවීම සමග ඇසුරු කළේය. දෙවැනිව කී ගණයේ රුපි. දශ ලක්ෂ 65.1 ක නිමැවුමෙහි වැඩිවීම 7881 ක් වූ අතිරේක සේවක සංඛ්‍යාව ඇසුරු කැරුනකි. එසේ වුවද, මේ උභය ගණයන් හි ඒක සේවක අත්තම් ගණන පහත වැටී ඇත. පළමු වන ගණයෙහි එකී පහත වැටීම 266 සිට 262 දක්වා වූ අතර, දෙ වැනි ගණයෙහි පහත වැටීම 258 සිට 253 දක්වා වීය. කර්මාන්තයේ අනෙකුත් සියළුම ගණයන් හී ( කලින් සඳහන් කොට නොමැති භාණ්ඩයන් හැර ) ඒක සේවක මිනිස්දින ගණන වැඩි වීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1968 දී වශයෙන් ඒක සේවක මිනිස්දින ගණන 10 කින් වැඩි වී ඇත. 1967 දී 19,315,000 ක් වූ මුළු අත්තම් ගණන 1968 දී 27,462,000 ක් දක්වා වැඩි වූ අතර, ප්‍රතිශත වැඩිවීම 42.2 ක් විය. 1968 දී කර්මාන්ත නිෂ්පාදන වටිනාකම වැඩිවීමට තරමක් දුරට හේතු වූ කරුණු වශයෙන් දැක්විය හැක්කේ, ශ්‍රමයේ ඵලදවෙහි වැඩිවීම බව පහත දැක්වෙන විශ්ලේෂණයෙන් පෙනී යයි.

## වැටුප්

මුළු වැටුප් වියදම, කාර්මික නිෂ්පාදනයෙහි රුපි. දශ ලක්ෂ 444.4 ක හෙවත් සියයට 46.6 ක වැඩිවීමකට අනුරූපව, රුපි. දශ ලක්ෂ 128.0 සිට රුපි. දශ ලක්ෂ 188.4 දක්වා හෙවත් සියයට 47.2 කින් වැඩිවීමක් සිදු වී ඇත. මූලික ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයෙහි අත්තමකට ඉහළ වැටුපක් ඇති අතර, මෙකී සාපේක්ෂක වශයෙන් ඉහළව පවතින වැටුප් ප්‍රමාණයට රාජ්‍ය අංශයෙහි හුදෙක් එක් ව්‍යාපාරික ආයතනයක් පමණක් හේතු වී ඇත. ලෝහ නොවන ඛණිජ ද්‍රව්‍ය

## සංඛ්‍යා සටහන II (ආ) 6

## නිෂ්පාදනය සහ අමුද්‍රව්‍ය — 1968

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය | අමුද්‍රව්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | එකතුව |
| 1. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය... ... ... | 159 | 148,704 | 49,443 (59.9) | 33,104 (40.1) | 82,547 (100.0) |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය ... ... | 467 | 160,529 | 36,923 (41.7) | 51,559 (58.3) | 88,482 (100.0) |
| 3. දැව, සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) ... ... ... | 19 | 16,638 | 5,848 (88.5) | 763 (11.5) | 6,611 (100.0) |
| 4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය ... ... ... | 77 | 51,165 | 8,985 (32.9) | 18,304 (67.1) | 27,289 (100.0) |
| 5. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පෙට්‍රෝලියම්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය ... ... | 270 | 186,423 | 28,231 (37.6) | 46,757 (62.4) | 74,988 (100.0) |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) ... ... ... | 48 | 90,466 | 6,499 (21.0) | 24,463 (79.0) | 30,962 (100.0) |
| 7. මූලික ලෝහ නිෂ්පාදිතයන් ... ... ... ... | 1 | 27,286 | 721 ( 3.7) | 18,638 (96.3) | 19,359 (100.0) |
| 8. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය | 238 | 161,835 | 14,952 (15.7) | 80,554 (84.3) | 95,506 (100.0) |
| 9. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නො සඳහන්) ... ... | 19 | 2,670 | 385 (19.6) | 1,581 (80.4) | 1,966 (100.0) |
| එකතුව ... ... ... ... ... ... | 1,298 | 845,716 | 151,987 (35.5) | 275,723 (64.5) | 427,710 (100.0) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සැ: යු: වරහන් තුළ වන ඉලක්කම්වලින් සියයට ගණන දක්වේ.

## සංඛ්‍යා සටහන II (ආ) 7

## නිෂ්පාදනය සහ ඉන්ධන — 1968

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය | පාවිච්චි කළ ඉන්ධන | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලිය බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| 1. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය ... | 82 | 88,494 | 1,082 | 84 | 125 | 123 | 1,414 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය ... | 146 | 103,543 | 998 | 28 | 235 | 684 | 1,945 |
| 3. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) ... | 11 | 10,502 | 65 | 4 | 4 | 4 | 77 |
| 4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය ... ... | 32 | 32,187 | 537 | — | 769 | 1 | 1,307 |
| 5. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය ... ... | 93 | 139,922 | 2,051 | 297 | 1,061 | 509 | 3,918 |
| 6. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) ... | 17 | 34,567 | 1,198 | — | 725 | 78 | 2,001 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිතයන් ... | 1 | 27,286 | — | — | 2,481 | — | 2,481 |
| 8. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය ... | 117 | 95,030 | 746 | 509 | 800 | 285 | 2,340 |
| 9. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක සඳහන් නොවන) | 7 | 759 | 7 | — | 6 | — | 13 |
| එකතුව ... ... ... | 506 | 532,290 | 6,684 | 922 | 6,206 | 1,684 | 15,496 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදිත කාර්මික ගණයෙහි එක් ශ්‍රම දිනක වැටුපෙහි විශාලතම වැඩිවීමක් සිදු වී ඇත. සාපේක්ෂකව ඉහළව පවතින වැටුප් ප්‍රමාණයන් ඇති රාජ්‍ය අංශයෙහි ව්‍යාපාරික ආයතනයන් තුනක් ඇත. රසායනික ද්‍රව්‍ය ගණයෙහි ශ්‍රම දිනයන් රු. 1.55 බැගින් වැඩිවීමක් සිදු වී ඇත. මෙම ගණයෙහි මිනිස් දිනක වැටුප රු. 9.86 ක් වන අතර, සියළුම කාර්මික ගණයන් අතුරින් තුන් වැනිව ඉහළ වැටුපක් ලැබෙයි. කෙසේ වුවද, මෙම සාමාන්‍ය කාර්මික ගණයට අයත් වන විදේශීය බෙහෙත් වර්ග සහ සෙසු රසායනික ද්‍රව්‍ය නිපදවන ව්‍යාපාරික ආයතනයන් හී ගෙවන ඉහළ වැටුප් පෙන්නුම් නොකරයි. ව්‍යාපාරික ආයතනයන් තුනකට එක් ශ්‍රම දිනකට රු. 20/- බැගින් වැටුපක් ඇත. මිනිස් දිනකට ඉහළම වැටුපක් ගෙවනු ලබන්නේ, වාර්තා සපයන ව්‍යාපාරික ආයතනයන් අතුරින් මෙකී විදේශීය ව්‍යාපාරික ආයතනයෝය. එක් මිනිස් දිනක් සඳහා, වැටුප් කාර්මික ගණයන් දෙකක පහත වැටී ඇත. ආහාරපාන සකස් කිරීමේ කාර්මික ගණයෙහි රු. 7.17 සිට රුපි. 6.59 දක්වා සහ කඩදාසි නිෂ්පාදිත කාර්මික ගණයෙහි රු. 7.73 සිට 7.50 දක්වා වෙයි. ආහාරපාන සකස් කිරීමේ කාර්මික ගණය ඇතුළත වැටුප් අන්තරය මිනිස් දිනක් සඳහා රු. 3.60 ( විස්කෝතු, සහ රස කැවිලි ) සිට රු. 10.60 ( එළවළු තෙල් සහ මේද ) දක්වාය. බීම වර්ග නිපදවන කර්මාන්තයෙහි ද එක් මිනිස් දිනක් සඳහා රු. 10.22 ක ඉහළ වැටුපක් ඇත. II (ආ) 5 සහ II (ආ) 4 (1) යන සංඛ්‍යා සටහන් සංසන්දනය කරන කල්හි මුළු සේවා නියුක්තිය හා මුළු වැටුප් බිල, කෙරෙහි විශාල සියයට ගණනක් සම්පාදනය කරන ආයතන කිහිපයක් ඇති කර්මාන්තයන් හී ඉහළ වැටුප් ප්‍රමාණයක් ඇති බව පෙනී යයි. මේ අනුව, ඉහළ ප්‍රමාණයකින් එනම්, රු. 3.16 කින් එක් ශ්‍රම දිනක වැටුපක වැඩිවීමක් සිදු වී ඇති ලෝහ-නොවන නිෂ්පාදිත කාර්මික ගණයෙහි ව්‍යාපාරික ආයතනයන් හතක් විසින් මුල් නිෂ්පාදනයෙන් සියයට 80.3 ක් ද, සේවා නියුක්තියෙන් සියයට 55.6 ක් ද සහ මුළු වැටුප් බිලෙන් සියයට 66.0 ක් ද පාලනය කරයි. අනික් අන්තයෙන්, ආහාර සකස් කිරීමේ කාර්මික ගණසෙහි ව්‍යාපාරික යංකේන්ද්‍රණය වීම ඉතාමත් අඩු අතර, ව්‍යාපාරික ආයතනයන් 41 ක් පාලනය කරනුයේ මුළු නිෂ්පාදිතයෙන් සියයට 4.19 ක් තරමේ ප්‍රමාණයකි. මෙම කාර්මික ගණයෙහි කර්මාන්තයන් එක් ශ්‍රම දිනක වැටුපෙහි පහළ වැටීමක් දක්නට ලැබීම වැදගත් ලක්ෂණයකි.

### බලය සහ ඉන්ධන

බලය සහ ඉන්ධන යෙදීම භාවිතය II (ආ) 7 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි. ඉකුත් වර්ෂයන්හි දී මෙන්ම ව්‍යාපාර ආයතනයන් විශාල සංඛ්‍යාවක් බලය, ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව තොරතුරු සපයා නොමැත. ඉකුත් වර්ෂයේ දී ව්‍යාපාරික ආයතන 326 ක් හා සලකා බලන කල ප්‍රශ්න මාලාවේ මේ පිළිබඳව තොරතුරු සපයා ඇත්තේ, මේ වසරේ එම ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 506 කි. නැවත වරක් මෙම ව්‍යාපාරික ආයතනයන් බලය ප්‍රධාන වශයෙන් ලබා ගන්නා ලද්දේ විදුලි බලයෙනි. පාවිච්චි කරන ලද විදුලි බලයේ වටිනාකම රුපි. දශ ලක්ෂ 6.7 කි. 1968 කර්මාන්තයන් සඳහා පෙට්‍රෝල් සහ තෙල් ද බලය ලබා ගැනීම සඳහා වැදගත් මාර්ගයක් විය. 1967 වර්ෂයේ රුපි. දශ ලක්ෂ 3.6 ක් හා සසඳන කල්හී, 1968 වර්ෂයේ දී පාවිච්චියට ගනු ලැබූ පෙට්‍රෝල් සහ තෙල් වල වටිනාකම රුපි. දශ ලක්ෂ 6.2 කි. 1967 වර්ෂයේ සත .037 හා සලකා බලන කල, 1968 දී රුපියලක් වටිනා නිමැයුමෙහි බලය සඳහා වියදම ශත .029 කි.